`

PN/SSCL/2024-01
26.03.2024

# දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

## බදු ගෙවන්නන් වෙත කෙරෙන නිවේදනයයි

## 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත සංශෝධනය කිරීම

2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන) පනත 2024 මාර්තු මස 20 වන දින සහතික කර ඇති අතර එම සංශෝධනය අනුව 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතට වන සැළකිය යුතු වෙනස්කම් පහත පරිදි වේ.

**ලියාපදිංචි විය යුතු සීමාව**

බදු අයකළ හැකි කාලසීමාව වන කාර්තුවකට රුපියල් මිලියන 15 හෝ ආසන්න කාර්තු හතරකට රුපියල් මිලියන 60 ඉක්මවන තැනැත්තකු 2024 ජනවාරි 01 වන දින සිට සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද සඳහා ලියපදිංචි විය යුතුය. ඒ අනුව, මෙතෙක් ලියාපදිංචි වී නොමැති තැනැත්තන් මෙම (සංශෝධන) පනත ක්‍රියාත්මක වන දිනය වන 2024 මර්තු 20 වන දින සිට දින පහළොවකට නොවැඩි කාලයක් තුළ ලියාපදිංචි විය යුතුය (2024 අප්‍රේල් 04 වන දිනට පෙර).

**Commissioner General of Inland Revenue**

TAXES - FOR A BETTER FUTURE